කොළඹ විශ්ව විද්‍යාලයේ අධ්‍යාපන පීඨයේ අධ්‍යාපන දර්ශනපති උපාධිය සඳහා ඉදිරිපත් කරනු ලබන පර්යේෂණ නිබන්ධනය

# ජාතික අධ්‍යාපන ආයතනය මෙහෙයවන පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාවේ ප්‍රාථමික අධ්‍යාපනය ඉගැන්වීමේ විශේෂ ක්‍රම හදාරන උපාධිධාරී ගුරු සිසුන්ගේ ගුරු පුහුණු අවශ්‍යතා ඉටු වෙන ආකාරය පිළිබඳ අධ්‍යයනයක්

UCLIB
466551

එන් වික්‍රමසිංහ
91/ M.Phil/47

466551

# සාරාංශය

වත්මන් ශ්‍රී ලංකාවේ ප්‍රාථමික අධ්‍යාපන ක්ෂේත්‍රය පිළිබඳව සලකන විට හඳුනාගත හැකි සුවිශේෂ ලක්ෂණ කීපයක් වේ. ඒවා

- H ප්‍රාථමික පාසල් සඳහා ම සුවිශේෂ සංකල්ප
- H ප්‍රාථමික පාසලේ ඉගෙන ගන්නා ළමුන්ගේ විවිධතා නිසා පැන නගින ලක්ෂණ
- H ප්‍රාථමික පාසලට විශේෂ වූ ඉගැන්වීම් ක්‍රම ශිල්ප

යනාදී වශයෙන් වෙන්කර දැක්විය හැකිය.

ළමා සංවර්ධනයට අදාළ වූ මනෝවිද්‍යාත්මක සාධක මත හා අධ්‍යාපන මූල්ධර්ම ක්‍රියාවට නැඟීමට ගෙන ඇති ප්‍රයත්නවල ප්‍රතිඵලයක් වශයෙන් ඉහත මුල් කරුණු දෙක පදනම් කරගෙන ප්‍රාථමික පාසලට සුවිශේෂ වූ ඉගෙනුම් ක්‍රම ශිල්ප ගොඩනැගී ඇත.

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ අතුරු වාර්තාව අනුව වත්මන්හි ශ්‍රී ලංකාවේ ශිෂ්‍යයකු විසින් ලබා ගත යුතු අවම නිපුණතා පහක් හඳුනාගෙන තිබේ. මෙම නිපුණතා ලබාගැනීමට නම් ප්‍රාථමික අධ්‍යාපනයේ සිටම දරුවන් ඒ සඳහා යොමුකළ යුතුව ඇත. එහිලා ප්‍රාථමික පාසලේ දී ඊට අදාළ ඉගැන්වීම් ක්‍රම ශිල්ප භාවිත කිරීමේ වැදගත්කම ද ඉස්මතු වේ. ප්‍රාථමික පාසලේ උගන්වනු ලබන ගුරුවරුන් විසින් ඉහත සඳහන් ක්‍රම සංකල්ප, විවිධතා හා අපේක්ෂිත නිපුණතා වලට අනුකූල ඉගැන්වීම් ක්‍රම ශිල්ප වලට අදාළ අත්දැකීම් රාශියක් තම වෘත්තීය පුහුණුවේදී ලබාගත යුතුව ඇත. ප්‍රාථමික පංතිවලට උගන්වනු ලබන උපාධිධාරී නොවන ගුරුවරයකු හෝ උපාධිධාරී ගුරුවරයකුට හෝ මේ කරුණු මෙලෙසින්ම බලපානවා ඇත.

ඕනෑම කෙනෙකුගේ ඉදිරි අනාගතය තීරණය කිරීමට සවිමත් වටිනාකමක් සහිත පදනමක් ඇති කරන ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳව සුවිශේෂ වශයෙන් සැළකිල්මත්වීමේ අවශ්‍යතාවක් ඇති බැව් අවධාරණය කෙරේ. මේ අවධාරණය ඉස්මතු කරන සාධකයක් ලෙසට උපාධිධාරීන් වෘත්තීය පුහුණුව ලබා දෙන පශ්චාත් උපාධි

අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාවට ප්‍රාථමික අධ්‍යාපන විෂය ක්ෂේත්‍රය ඇතුළත්වීම සැලකිය හැකිය.

එවැනි විෂය සන්ධාරයක් සහිත වූ ජාතික අධ්‍යාපන ආයතනයේ පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාවෙන් අපේක්ෂිත අරමුණු ඉටු වූ ප්‍රමාණය ඇගැයීමට ලක්කිරීම මෙම පර්යේෂණයේ අරමුණ වේ. එහිලා ප්‍රාථමික පාසලේ ගුරුවරයකු විසින් තම වෘත්තීය පුහුණුවේදී සපුරාගත යුතු පුහුණු අවශ්‍යතා හඳුනා ගත යුතු විය.

මේ සම්බන්ධයෙන් වන සාහිත්‍ය විමර්ශනය කිරීමෙන් (දෙවන පරිච්ඡේදය) එම පුහුණු අවශ්‍යතා හඳුනාගනු ලැබීය. මෙම අවශ්‍යතා ප්‍රමුඛත්වය මත පෙළ ගැන්වීමෙන් අදාළ මූලික පුහුණු අවශ්‍යතා ක්ෂේත්‍ර 7ක් හඳුනාගන්නා ලදී. එම ක්ෂේත්‍ර

i. න්‍යායාත්මක දැනුම
ii. ඉගැන්වීමේ ක්‍රම
iii. ගුරු කුසලතා
iv. ඉගැන්වීමේ ආධාරක
v. කළමනාකරණ කුසලතා
vi. පර්යේෂණ කුසලතා
vii. පාඨමාලා අන්තර්ගතය

යනුවෙන් දැක්විය හැකිය.

පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාවේ ප්‍රාථමික අධ්‍යාපන විශේෂ ක්‍රම විද්‍යාව විෂයය හැදෑරූ ගුරු සිසුන් තුළ ප්‍රාථමික අධ්‍යාපනයට අදාළ වෘත්තීය පුහුණු අවශ්‍යතා සපුරා ලීම සඳහා එම පාඨමාලාව කොතරම් ඉවහල් වී දැයි පිරික්සීම සඳහා කරන ලද පර්යේෂණ ක්‍රම විද්‍යාව තෙවන පරිච්ඡේදයේදී විස්තර වේ. ඒ අනුව ගුරුවරුන් 270කින් සමන්විත ගුරු නියැදියක් පාඨමාලාව හැදෑරීමට පෙර හා හැදෑරූ පසු පර්යේෂණයට භාජන කරන ලදී.

මෙම ගුරුවරුන් තෝරා ගන්නා ලද්දේ අධ්‍යාපන පහසුකම් අනුව හඳුනාගත් කලාප තුනකිනි. පහසුකම් සහිත ප්‍රදේශ



University of Colombo Library

නියෝජනය කරනු පිණිස කොළඹ, ගම්පහ කලාපයත්, මධ්‍ය ප්‍රමාණයේ පහසුකම් සහිත ප්‍රදේශය වෙනුවෙන් කුරුණෑගල කලාපයත්, දුෂ්කර ප්‍රදේශ නියෝජනය සඳහා අනුරාධපුරය මොනරාගල කලාපයත් මේ සඳහා තෝරාගන්නා ලදී. එක් එක් කලාපය සඳහා තෝරාගත් නියැදියෙන් අර්ධයක් ගුරුවරුන්ද, අර්ධයක් ගුරුවරියන්ද විය. එසේම සේවා කාලයට අනුව අවු. 3 ට අඩු, අවුරුදු 3-6ත් අතර, අවු. 6 ට වැඩි, යනාදී වශයෙන්ද නියැදිය වර්ග කිරීමක් ද විය.

සමස්ථ පර්යේෂණ ක්‍රියාවලිය සඳහා පහත සඳහන් ක්‍රියා පියවරවල් අනුගමනය කරන ලදී.

- පර්යේෂණ සාහිත්‍ය සමාලෝචනයෙන්, ප්‍රාථමික ගුරු පුහුණු අවශ්‍යතා හඳුනා ගන්නා ලදී.
- තවදුරටත් ගුරු පුහුණු අවශ්‍යතා හඳුනා ගැනීම පිණිස පාඨමාලාව හදාරණ ගුරුවරුන් සමග අවිධිමත් සාකච්ඡා මෙහෙයවන ලදී.
- ගුරුපුහුණු අවශ්‍යතා පිළිබඳව අව්‍යාජ තොරතුරු ලබාගැනීම පිණිස විදුහල්පතිවරුන් මෙන්ම ගුරු අධ්‍යාපනඥයන්ගේ ද අදහස් සැලකිල්ලට භාජනය කරන ලදී.
- නියාමක පරීක්ෂණයට බඳුන් කොට සංශෝධනය කරන ලද ප්‍රශ්ණාවලිය අදාළ ගුරුවරුන්ගේ ප්‍රතිචාර ලබා ගැනීම පිණිස පාඨමාලාවට බැඳුන මුල් අවස්ථාවේදීද, පාඨමාලාව හැදෑරූ පසුද ගුරු සිසුන් වෙත යොමු කරන ලදී.

- ලිඛිතව ප්‍රකාශ කරනු ලැබූ කරුණු වල නිරවද්‍යතාවය සොයාගැනීම පිණිස එම ගුරුවරුන් සමග අවිධිමත් සාකච්ඡා පවත්වන ලදී. මේ සම්බන්ධව වැඩිමනක් විස්තර තෙවන පරිච්ඡේදයේදී විස්තර වේ.

ලබාගත් දත්ත විශ්ලේෂණය කල ආකාරය 4වන පරිච්ඡේදයේදී දක්වා ඇත. ඒ අනුව ප්‍රමාණාත්මක දත්ත ප්‍රතිශත ගණනය මගින් හා කයි වර්ග පරීක්ෂාව මගින් විශ්ලේෂණයට භාජනය කරන ලදී.

විශ්ලේෂිත දත්ත මත න්‍යායාත්මක කරුණු ඉගැන්වීමේ ක්‍රම, හා ගුරු කුසලතා හා සම්බන්ධ දැනුම් කුසලතා ප්‍රමාණවත් ලෙස ලබාදීමට පාඨමාලාව සමත් වූ බවක් විද්‍යමාන විය. විශ්ලේෂිත දත්ත මත ඉගැන්වීමේ ආධාරක සම්බන්ධයෙන්වූ දැනුම් කුසලතා ලැබී ඇති සැටියක් පෙනුනත්, සම්මුඛ සාකච්ඡා වලදී හෙළිවූ කරුණු ද සැලකිල්ලට ගත්විට, මේ සම්බන්ධ ප්‍රමාණාත්මක කුසලතා ලැබුන සැටියක් නොපෙනේ. ප්‍රාථමික පන්ති කළමනාකරණය හා පර්යේෂණ කුසලතා හා සම්බන්ධ දැනුම් කුසලතා ප්‍රමාණවත්ව ලබාදීමට පාඨමාලාව සමත්වී ඇති සැටියක් නොපෙනේ.

මේ සම්බන්ධයෙන් අදාළ නිගමන හා යෝජනා 5වන පරිච්ඡේදයේ දී ද දක්වා ඇත. හඳුනාගත් පුහුණු අවශ්‍යතා සම්බන්ධව එක් එක් ක්ෂේත්‍රයට අදාළව සුවිශේෂව එම නිගමන හා යෝජනා ඉදිරිපත් කොට ඇත.